*සැ. යු.*– මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2002 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ ජූලි-සැප්තැම්බර් කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,501- 2007 ජුනි 08 වැනි සිකුරාදා - 2007.06.08

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 504 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 507 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජුනි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජුනි මස 01 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුවේ නිවේදන

## 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත අංක 25/26 වෙනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත් වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයන් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව.

2007 මැයි මස 16 වැනි දින,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,
අංක 428/11, වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

### උපලේඛනය

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 40361 | දෙහිවල ලියනගේ සාගරිකා මිය, අංක 424/1, දංගොල්ල පාර, පහළ තල්දූව, අවිස්සාවේල්ල. | මුදලි මහීපාල අප්පුහාමිලාගේ රූපවතී (මියගිය) මහත්මියගේ උරුමකරුවන්,<br>1. පී. ටියුඩර් තිසේරා මයා, අංක 441/2, ප්‍රගතිපුර, පුවක්පිටිය.<br>2. මුදලිගේ දෝන දෙවහනී චම්පිකා වල්පොල මිය, අංක 64, මාලිගාව මාවත, සීතාවක, අවිස්සාවේල්ල.<br>3. සරෝජා රසාංගනී වල්පොල මිය, අංක 3, නගර සභා නිවාස, සීතාවක පාර, අවිස්සාවේල්ල.<br>4. වසන්ත වල්පොල මයා, නුගේවත්ත, අවිස්සාවේල්ල. |
| (02) 40484 | බලපිටිය ලියනගේ ගාමිණී මයා, අංක 91ඒ, පරාක්‍රම පාර, තංගල්ල. | ඉෂාන් ගයා ශ්‍රී සෙල්ලහේවා මයා, "කාන්ත", කදුරුපොකුණ පාර, තංගල්ල. |
| (03) 40550 | තෙන්නකෝන් මුදියන්සේලාගේ සෝමසිරි මයා, කන්ද පාර, තල්ගහවත්ත, කරන්දෙණිය. | කළුවාදේව ඉන්ද්‍රාවතී මිය, කටුකනත්ත, කරන්දෙණිය. |
| (04) 40551 | සිංහාධිපති මංචනායක, අප්පුහාමිලාගේ ශ්‍රියානි මංචනායක මිය, අංක 604/53, 8 වෙනි පටුමග, මාලිගාවත්ත, කිරිදිවැල. | වලිමුණිගේ ලීල් කුමුදු ධම්මික රණතුංග මයා, අංක 28, මිල්ලතේ, කිරිඳිවැල. |

06-136

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ලබුගම කරුණානායකගේ රත්නසිරි නමැති, ලංකාව් රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. -

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද* |
|---|---|---|---|---|---|
| 1400 | 2007.04.04 | ද පෙන්ටකොස්ටල් ඇසෙම්බ්ලීස් ඔෆ් ශ්‍රී ලංකා | වැලිවේරිය | ආර්. එච්. එම්. සිරිවර්ධන පියතුමා | ක්‍රිස්තියානි |

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11.
2007 මැයි මස 15 වැනි දින,

06-192

---

## උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

### 5 වෙනි වගන්තිය යටතේ නිවේදනය

110 වෙනි අධිකාරය වූ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 5 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය කරු ජයසූරිය වන මම, 1935 සැප්තැම්බර් මස 20 වෙනි දින අංක 8146 දරන *ගැසට් පත්‍රයේ* අතිරේකයෙහි පළ කරනු ලැබූ නිවේදනය එහි මධ්‍යම පළාත, මහනුවර දිස්ත්‍රික්කය යන ශීර්ෂය යටතේ :

පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත :

හාරිස්පත්තුව පල්ලේගම්පහ දකුණ අංක 02 උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ වන අංක 14 දරන විෂය වෙනුවට මෙහි වූ "අ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ද

අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත :

හාරිස්පත්තුව පල්ලේගම්පහ දකුණ අංක 02 උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් කොට්ඨාසයට අදාළ වන අංක 14 දරන විෂයට ඉක්බිතිව මෙහි වූ "ආ" දරන අළුත් විෂය ඇතුළත් කිරීමෙන්.

2007.04.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

කරු ජයසූරිය,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2007 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ දී.

### මහනුවර දිස්ත්‍රික්කය

*පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*

"අ" උපලේඛනය

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත හාරිස්පත්තුව පල්ලේගම්පහ දකුණ අංක 02 උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය -

මුල්ලේගම කළුවාන පාර දෙපස
දීවානවත්තගම
කහවත්තගම
කළුවාන ජනපදය
කළුවානගම
කෝපිවත්ත ජනපදය
මුල්ලේගම

*අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*

"ආ" උපලේඛනය

පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත "හාරිස්පත්තුව උඩගම්පහ අංක 03" උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය

අකුරණගම
බෝසංගම
දොඩංගොල්ල
කසාවත්ත
මාච්චින ගම
පල්ලේවැලිකැටිය
පල්ලිය කොටුව
පිලිකරගම
උඩවැලිකැටිය

06-191

## වෙරළ සංරක්ෂණය පනතේ 16 වැනි වගන්තියේ 2 (ආ) වන උපවගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

### යෝජිත කුඩා සුඛෝපභෝගී හෝටල ව්‍යාපෘතිය - කරුක්කපනේ

### පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 16(1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව කොළඹ 03, ශාන්ත අන්තෝනි මාවත, අංක 70, ලකී ප්ලාසා, දෙවන මහල, ලාෆ්ස් ලෙෂර් ලිමිටඩ් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද "යෝජිත කුඩා සුඛෝපභෝගී හෝටල ව්‍යාපාතිය" සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථාන වල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2007.06.11 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන්හි පරීක්ෂා කළ නොහැක.)

| | | | |
|---|---|---|---|
| 1. | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | - | නව මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. |
| 2. | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - | නව මහලේකම් කාර්යාලය, 4 වන මහල, මාළිගාවත්ත, කොළඹ 10. |
| 3. | වයඹ පළාත් පරිසර අධිකාරිය | - | පළාත් සභා සංකීර්ණය, මාළිගාව, කුරුණෑගල. |
| 4. | නාගරික සංවර්ධන අධිකාරිය | - | සෙත්සිරිපාය, බත්තරමුල්ල. |
| 5. | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය | - | අංක 80, ගාලු පාර, කොළඹ 03. |
| 6. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | පුත්තලම |
| 7. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | ආරච්චිකට්ටුව |
| 8. | ප්‍රාදේශීය සභාව | - | ආරච්චිකට්ටුව |
| 9. | දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කාර්යාලය | - | මහවැව |
| 10. | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - | ප්‍රාදේශීය කාර්යාලය, රේගුව පාර, මීගමුව. |

මෙම යෝජිත කුඩා සුඛෝපභෝගී හෝටල ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2007.06.11 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

ඉංජිනේරු එච්. එන්. ආර්. පෙරේරා,
වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල,
මාළිගාවත්ත,
කොළඹ 10.

දුරකතන අංක : 011-2449754, 011-2387922, 011-2472623.
ෆැක්ස් අංක : 011-2438005, 011-2472623.

06-182

---

## 1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි

1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසිවල 3 වන රෙගුලාසි ප්‍රකාරව තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්, මහේෂ් ලසන්තා ගම්මම්පිල වන මම, පහත සඳහන් කාලය තිස්සමහාරාම වන්දනා රෙගුලාසි බල පවත්වන කාලය වශයෙන් නියම කරමි.

2007 වර්ෂයේ පොසොන් උත්සවය 2007 ජුනි මස 24 වෙනි දින සිට 2007 ජූලි මස 01 වැනි දින දක්වා වේ. (2007 ජුනි මස 24 හා ජූලි මස 01 දින ද ඇතුළත් වේ.)

එම්. එල්. ගම්මම්පිල,
ප්‍රාදේශීය ලේකම්,
තිස්සමහාරාම.

2007 මැයි මස 16 වැනි දින,
තිස්සමහාරාම,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-167

## මාතර තොටමුණ පොසොන් මහා පෙරහැර

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන 2007 පොසොන් මහ පෙරහැර 2007 ජුනි මස 30 වන දින පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥා පණත යටතේ (175 පරිච්ඡේදයේ) 1959 නොවැම්බර් මස 20 දින නිකුත් කරන ලද 11959 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසිවල 10 වන වගන්තිය යටතේ මෙයින් දන්වමි.

තුසිත පී. වනිගසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2007 මැයි මස 18 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-141

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

### 1990 අංක 4 දරන බැංකු පනත මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් විසින් අනුමත කරන ලද යෝජනා සම්මුතියේ දැන්වීම ය.

පහත දැක්වෙන යෝජනා සම්මතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව අනුමත කරන ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. වීරසේකර විසින් සහතික කරන ලද වර්ෂ 2005 ක් වූ ජනවාරි මස 31 වන දිනැති අංක 182 දරන උකස් බැඳුම්කරය මගින්, රාගම, හීන් කෙන්ද, අංක 526 දරන ස්ථානයේ එන්දිරියන්වලගේ දිලිප් කුමාර එදිරිසිංහ යන අය, ඔහු විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපල සහ පරිශ්‍රයන්, කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76 හි පිහිටි (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කෙරෙන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත උකස් කරන ලද හෙයින් ද,

තව ද, එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල ගෙවීමට එකී එන්දිරියන්වලගේ දිලිප් කුමාර එදිරිසිංහ යන අය පැහැර හරින ලදුව වර්ෂ 2006 ක්වූ මාර්තු මස 02 වන දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත එකී බැඳුම්කරය මත රුපියල් තුන්මිලියන පනස් දෙදහස් දෙසියකුත් සත හැට අටක (3,052,200.68) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන් දේපළ සහ පරිශ්‍රයන්, එකී රුපියල් තුන්මිලියන පනස් දෙදහස් දෙසියකුත් සත හැට අටක (3,052,200.68) මුදල ද, වර්ෂ 2006 ක්වූ මාර්තු මස 02 වන දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂ 2006 ක්වූ මාර්තු මස 02 වන දින වන විට හිඟව ඇති ප්‍රාග්ධන මුදල වන රුපියල් දෙමිලියන නවලක්ෂ පනස් හයදහස් දෙසිය දහතුනකුත් සත විසිතුනක (රු. 2,956,213.23) මුදලක් මත එක් වර්ෂයකට 19% ක අනුප්‍රමාණය බැගින් තවදුරටත් පොළිය ද, ඒ සමඟ අනුගාමී ගාස්තු ද, ප්‍රචාරය කිරීමේ ගාස්තු ද, වැය කරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (කිසියම් මුදලක් වේ නම්) මුදල අඩු කළ පසු මුදල, අයකර ගැනීම සඳහා කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ. කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව ඇතුළත මහරගම ග්‍රාමයේ, නාගහවත්ත පාර වරිපණම් අංක 139 දරන ස්ථානයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද වර්ෂ 1967 ක්වූ සැප්තැම්බර් මස 06 වන දිනැති අංක 1290 දරන පිඹුරේ ලොට් 8 වශයෙන් දැක්වෙන, නාගහවත්ත, යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එහි පිහිටි ගොඩනැගිලි, ගහකොල, වැවිලි සහ සියලුම දේ ද සමග වන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, එකී ලොට් 8 දරන ඉඩම් කැබැල්ලට මායිම්. *උතුරට* : මෙහි ලොට් 9 සහ 23 ද, *නැගෙනහිරට* : මෙහි ලොට් "ඒ" ද *දකුණට* : නාගහකනත්ත පාර රක්ෂිතය ද සහ *බස්නාහිරට* : මෙහි ලොට් "බී" ද වන අතර එකී අංක 1290 පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම පහක් (0අ. 0රූ. 20.5 පර්චස්) වේ.



මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එම් 908/247 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 8 නැවත මැනීමක් කරනු ලදුව මෙහි පහත දැක්වෙන පරිදි විස්තර වේ.

ඉහත කී මහරගම ග්‍රාමයේ, නාගහවත්ත පාර, වරිපනම් අංක 139 දරන ස්ථානයේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. සමරනායක විසින් සාදන ලද වර්ෂ 2001 ක්වූ ජුනි මස 14 වන දිනැති අංක 7374 දරන පිඹුරේ ලොට් 8 වශයෙන් දැක්වෙන නාගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එහි පිහිටි ගොඩනැගිලි, ගහකොල, වැවිලි සහ සියලුම දේ ද සමග වන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී ලොට් 8 දරන ඉඩම් කැබැල්ලට මායිම්, *උතුරට* : එකී අංක 1290 දරන පිඹුරේ ලොට් 9 සහ 23 ද, *නැගෙනහිරට* : එකී අංක 1290 දරන පිඹුරේ ලොට් "ඒ" දැන් ප්‍රසිද්ධ පාර ද, *දකුණට* : නාගහකනත්ත පාර සහ *බස්නාහිරට* : එකී අංක 1290 දරන පිඹුරේ ලොට් "බී" දැන් ප්‍රසිද්ධ පාර ද වන අතර, එකී අංක 7374 පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 20.5) හෝ හෙක්ටාර් 0.0518 ක් වේ.

පහත ඉඩමේ මාර්ග අයිතිය හා අනෙකුත් පොදු අයිතිවාසිකම් සමග:

ඉහත කී මහරගම ග්‍රාමයේ පිහිටි නාගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන එකී අංක 1290 දරන පිඹුරේ දැක්වෙන (අඩි 20 ක් පළල පාරක් සඳහා වූ වෙන් කිරීම දැන් ප්‍රධාන පාර) ලොට් "ඒ" වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී ලොට් "ඒ" දරන ඉඩම් කැබැල්ලට මායිම්, *උතුරට* : පතිරගෙකුඹුර කුඹුර සහ ලොට් 18 සිට 21 සහ "ඩී" ද *නැගෙනහිරට* : පතිරගෙකුඹුර කුඹුර ද *දකුණට* : ලොට් 10 සිට 15, 22 සහ 23 සහ නාගහවත්ත පාර රක්ෂිතය ද සහ *බස්නාහිරට* : ලොට් 17, 22, 23 සහ 8 ද වන අතර එකී අංක 1290 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දෙකයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 2.50) වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2522/61හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 76, යෝර්ක් වීදිය,
කොළඹ 01.

06-162

---

## රුහුණ සංවර්ධන බැංකුව - ගන්දර ශාඛාව

### 1990 අංක 04 දරන මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරනලද 1998.04.24 වැනි දින දරන *විශේෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2002.08.07 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සරෝජිනී වික්‍රමසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 1998.06.10 දිනැති අංක 1142 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දෙවිනුවර, ලයිට්හවුස් පාර, "සැනසුම" පදිංචි නාරාතොටහේවගේ සුනිල් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හතලිස්දහස් හයසීයයක (රු. 3,40,600) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීටම ඇති බැවින් ද, 2002.08.07 දින සිට වර්ෂයකට 26% බැගින් රුපියල් තුන්ලක්ෂ හතලිස්දහස් හයසීයයක (රු. 3,40,600) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදල් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 1142 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, දෙවිනුවර ගමේ දෙවිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි පරිපනම් අංක 224 දරන මාතර රික්වෙස්ට් උසාවියේ සී. ආර්. 4674 දරන නඩුවේ ගොනුවී ඇති 2375 දරන සැලැස්මේ මැනවින් නිරූපනය වී දැක්වෙන ඒ හා බී අක්ෂර දරන කැබලිවලින් සමන්විත ගුරුවේ පදිංචිව හිටියවත්ත, නැමති ඉඩමට මායිම් උතුරට : අබරන් ලොකුරාල පදිංචිව හිටිවත්ත *හෙවත්* කිලන්නයිදෙගෙවත්ත, නැගෙනහිරට : ඔලොක්කුව ද, දැනට මඩමවැල්ල පාර ද, දකුණට හා බස්නාහිරට : පාර ද, යන මායිම් තුළ පර්චස් තිහයි දශම හතයි නවයක් (අ. 0, රූ. 0, පර්. 30.79) ක් විශාල ඉඩම නැවත මැන සකස් කරන ලද බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. සුනිල් මහතාගේ අංක 91 හා 1998.03.28 දරන සැලැස්ම ප්‍රකාර මායිම් උතුරට : අබරන් පදිංචිව හිටියවත්ත *හෙවත්*, කිලන්නයිදෙගෙවත්ත, වෙන් කරන ප්‍රදීපාගාර මාවත, නැගෙනහිරට : මඩම්වැල්ල පාර ද, නැගෙනහිරට : පුමේ පදිංචි වත්ත හෙවත්, පිටකොරටුව හෙවත් ගෙදරවත්ත, බටහිරට : සිංහාසන පාර යන මායිම් තුළ පිහිටි කැබලි අංක 01 ලෙස දක්වා ඇති පර්චස් විසිහයයි දශම හයයි නවයක් (අ. 0, රූ. 0, පර්. 26.69) ක් විශාල ඉඩමත්, එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යනාදී සියළුම දේ සම්පූර්ණයෙන් ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී/497/39හි ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ටී. ජී. විමලරත්න,
සාමාන්‍යාධිකාරී.

2002ක් වූ අගෝස්තු මස 07 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන, මාතර.

06-161

---

## මහජන බැංකුව- ගාල්ල මහවීදිය (169)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.04.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් සෝමපාල හොරදුගොඩ ගමගේ මහතා විසින් සහතික කරන ලද 2004.12.20 දිනැති අංක 685 දරන උකස්ප්‍රකාර ගෙවීම, නන්දා බියට්‍රිස් ධර්මලතා සෙනෙවිරත්න, ගල්හේන ගමගේ ගජමිණි චන්දිම ඩයස් සෙනෙවිරත්න, සහ ගල්හේන ගමගේ දියමිණී සහන් ඩයස්, සෙනෙවිරත්න,

යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක් ලක්ෂ හතලිස් හත්දහස් පන්සීයක (රු. 147,500.00) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.01.20 දින සිට වර්ෂයට 18.75% බැගින් එකී රුපියල් එක් ලක්ෂ හතලිස් හත්දහස් පන්සීයක (රු. 147, 500.00) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක් ලක්ෂ හතලිස් හත්දහස් පන්සීයක (රු. 147,500) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 685 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

දකුණු පලාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, ගාලු කඩවත් සතරතුල උණවටුන පිහිටි රුමස්සල කන්ද *නොහොත්* බොනවිස්ටා *නොහොත්* බොනවිස්ටා ළමා නිවාසය සහ සුදර්ශණ, ඉඩමට බලයලත් මානක එස්. ජී. වීරසූරිය විසින් 1993.06.24 සහ 27 දිනයන්හි මැන සම්පාදිත අංක 191 ඒ දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 17 ලෙස ලකුණු කර ඇති ඉඩම, උතුරට : කැබලි අංක 11 (අඩි 12 ක් පලල පාර), නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 16, දකුණට : මෙම ඉඩමේ කැබලි අංක 18 සහ බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 20 ද යන සතර මායිම් තුළ පර්චස් පහළොවක (අක්. 0, රූ. 0, පර්. 15) ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ඇතුළු සියළු දේ ද වේ.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කාර්යාලයේ අංක ඩී 780/252 යටතේ ලියා පදිංචි කර ඇත.

තව ද ඉහත කී අංක 191 ඒ දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 11 දරන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නො. 22,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

06-214

---

## මහජන බැංකුව

### 1986 අංක 32 දරණ පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 29D වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරණ පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 29D වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ

මණ්ඩලය විසින් 2005.07.05 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. නානායක්කාර මහත්මිය විසින් සහතික කරන ලද 2003.09.08 වන දිනැති අංක 1975 දරන උකස්කරයේ ප්‍රකාර ගෙවීම් තමරා කුමාරි රිදීමාලියද්ද මහත්මිය හා ඒකනායක මුදියන්සේලාගේ විනීතා කුමාරිහාමි මහත්මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද එකී අංකය 1975 දරන උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ විසිතුන්දාස් නවසිය හැටක් (රු. 2,23,960) මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින්ද එකී රුපියල් දෙලක්ෂ විසිතුන්දාස් නවසිය හැටක (රු. 2,23,960) සඳහා 2004.05.28 දින සිට සියයට දහඅටයි දශම පහ (18.5%) බැගින් පොලිය ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය ද, වෙන්දේසි ගාස්තුව ද, වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවාද අඩු කරගෙන අදාල මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. ජයතිලක මහතා විසින් එකී අංකය 1975 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද අංක 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29D යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බිම්තැන්න පත්තුවේ, දඹරාව ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ දඹරාව පිහිටි මිනින්දෝරු ජනරාල් සතුව තිබූ මිනුම් අංකය 56 ටෝපෝ ප්ලෑන්හි කැබැලි අංක 366-1/2 හා 366-2/2 යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම්වලින් කැබලි අංක 366-1/2 උතුරට : කැබැලි අංක 330/327 ද, නැගෙනහිරට : කැබැලි අංක 366-2/2 ද, දකුණට : කැබැලි අංක 372 හා බස්නාහිරට : කැබැලි අංක 365 ද යන ඉඩම ද, කැබැලි අංක 366-2/2 යනුවෙන් වෙන්කර ඇති උතුරට : කැබැලි අංක 327 ද, නැගෙනහිරට : කැබැලි අංක 367 ද, දකුණට : කැබැලි අංක 372 හා බස්නාහිරට : කැබැලි අංක 366-1/2 ද යන සීමාව තුළ පිහිටි අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් තිස්දෙකයි දශම තුන (අක්කර 02, රූඩ් 01, පර්චස් 32.3) ක විශාලත්වයෙන් යුතු ඉඩම හා එහි තුළ තිබෙන සියළු දේත් වේ.

මෙය බදුල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංකය LDO 99/584 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
බදුල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල.

06-215

## කොමර්පල් බැන්ක් ඔප් සිලෝන් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔප් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනාව

ණය ගිණුම් අංකය : 165334.

2006 අගෝස්තු මස 10 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඕෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. අබේවර්ධන විසින් සහතික කරන ලද 2003 ජූලි මස 03 වැනි දින හා අංක 2187 දරන කොමර්ෂල් බැන්ක් ඔප් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විතානගේ පද්මරත්න ජයවර්ධන සහ විතානගේ හරිස්චන්ද්‍ර ජයවර්ධන ණයකරුවන්/උකස්කරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පස්ලක්ෂ පනස් නව දහස් අටසිය දොළහයි හා ශත හැටහයක (රු. 5,59,812.66) මුදලක් 2006 ජූලි මස 07 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඕෆ් සිලෝන් ලිමිටඩ් වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පස්ලක්ෂ පනස් නව දහස් අටසිය දොළහයි ශත හැටයක (රු. 5,59,812.66) මුදලට 2006 ජූලි මස 08 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 4,37,500 මුදලට 17% බැගින් වැඩිදුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද මුදල් ද, වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදල් වේනම් ඒ මුදල ද අඩුකොට එකී අංක 2187 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඕෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇත්තාවූ ද, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝර්ප්ස් වීදියේ අංක 99 බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඕෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක එම්. එම්. ඩී. එස්. ශාන්ත විසින් 1998 අගෝස්තු මස 08 වැනි දින සාදන ලද අංක 1148 දරන පිඹුර පරිදි සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද පත්තු, අලකලන් කෝරළේ, ගොඩකවෙල ග්‍රාමයේ පිහිටි තිබ්බටුහේන හෙවත් තිබ්බටුහේන පහළ කැල්ල නමින් හැඳින්වෙන ඉඩම් කොටසට මායිම් උතුරට : මාදම්පේ හම්බන්තොට ප්‍රධාන පාර ද, නැගෙනහිරට : කුලතුංග ජයවර්ධන විසින් හිමිකම් කියන ඉඩම ද, දකුණට : දොඹවෙල දොල ද සහ බටහිරට : ධීරසිංහ විසින් හිමිකම් කියන ඉඩම ද, යන මායිම් තුළ පර්චස් තිස්දෙකයි දශම හයක (අ. 0, රූ. 0, පර්. 32.6) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි, වැවිලි හා වෙනත් සියළු දේත් සමඟ වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 354/50 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි වී ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

06-248

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1900001668.

ණයකරුගේ සම්පූර්ණ නම වන්ති ආරච්චිලාගේ සීතා පද්මණී සහ දහනක රාල්ලාගේ සරත් කුමාර.

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. එස්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 3634 හා 1998.11.13 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටහයදහස් එකසිය අසූදෙකයි ශත තිස්දෙකක (රු. 1,66,182.32) මුදලක් වර්ෂ 2004.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපිල් එක්ලක්ෂ හතලිස්තුන්දහස් හාරසිය විසිහතයි ශත හතලිහක (රු. 1,43,727.40) මුදල ද, වර්ෂ 2004.09.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිදෙදහස් හත්සිය පනස්හතරයි ශත අනූදෙකක් (රු. 22,754.92) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැටහයදහස් එකසිය අසූදෙකයි ශත තිස්දෙකක් (රු. 1,66,182.32) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හතලිස්තුන්දහස් හාරසිය විසිහතයි ශත හතලිහක (රු. 1,43,427.40) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොලියක් 2004.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. ජී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ නොවැම්බර් මස 25 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී එකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, යාගම් පත්තුවේ, උතුරු පිටිගල් කෝරළේ, හලාවත ප්‍රාදේශීය සභා සීමාවේ නෙළුම්පොකුණ ග්‍රාමයේ පිහිටි මිරිස්වත්ත නමැති ඉඩමට 1997.09.16 දින ඒ. පී. එස්. බී. පරාක්‍රම මානකතැන විසින් මැන සම්පාදිත අංක 1506බී පිඹුර ප්‍රකාර ලොට් 03ට මායිම් ඊසාණට : ඊ. ඒ. ගුණතිලකට අයත් තෙලඹුගහ වත්ත ද, ගිණිකොණට : පී. පී. පු. 1998 හි දැක්වෙන ලොට් 05 ද, නිරිතට : එම පිඹුරේම දැක්වෙන ලොට් 02 සහ පාර ලෙස ලකුණු කරන ලද ලොට් 04 ද, වයඹට : එච්. වික්‍රමතිලකට අයත් මිරිස්වත්ත ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතරයි දශම එකයි බිංදුවක (අ. 0, රූ. 0. පර්. 24.10) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ/මාද/9/66හි ලියාපදිංචි කර ඇත

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී

06-232